Buddhist Era 2547 Esala New Moon - Monday, July 28, 2003



රුහුණු පුද බිමේ ඇසළ අසිරිය

## ⁜ නැති කල කලණ මිතුරන් හුදකලා බව තමා මසුරන්

– බලංගොඩ ධම්මරතන හිමි

නුවණැ'ති කලණ මිතුරන් ඇසුරු කිරීමෙහි වැදගත්කම සහ නුවණ නැති – පහත් ගති ඇති මිතුරන් ඇසුරු කිරීමට වඩා හුදකලාව වාසය කිරීමේ අගය දැක් වූ බුද්ධ දේශනාවකට අර්ථකථනයක්, ඇසළ අමාවක පෝද ධර්ම දේශනාවෙන්.

## ⁜ කඩිනම් ශාසන ව්‍යාප්තියේ සැඟවුණු හේතු සාධක

**– රෙජී වීරමන් විසිනි**

බුදු සසුන එද භාරතය පුරා වේගයෙන් පැතිරී යැමට බල පෑ හේතු විග්‍රහ කිරීමට දරන ප්‍රයත්නයකි. බුදුරදුන්ගේ සුවිශේෂ කුසලතා සහ එද භාරත සමාජ පසුබිමේ පැවති විවිධ ලක්ෂණ – මේ සීඝ්‍ර ව්‍යාප්තියට හේතු වූ බව ලේඛකයා පවසයි.

## ⁜ සම්බුදු පදවි ප්‍රාප්තියට සපිරිය යුතු සුදුසුකම්

– කැටවල ඉන්දසාර හිමි

මානව බුද්ධි මහිමයේ උත්තරීතර ඵලය වූ සම්මා සම්බුද්ධත්වය ලැබීමට අදහස් කරන පුද්ගලයකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණ දහම් පිළිබඳ විමසුමකි.

## ⁜ යහපත් යුග දිවියකට දැහැමි මගක්

– දීපාල් සාගර ජයතිලක

යුග දිවිය සාර්ථක කරන බෞද්ධ මග පෙන්වීම. සැමියාගේ සහ බිරියගේ යුතුකම් හා වගකීම් ගැනද, ඒ දෙදෙනා අතර පැවතිය යුතු ආදරය හා ගෞරවය ගැන ද ලේඛකයා දැහැමි උපදෙස් ගවේෂණයක යෙදෙයි.

## ⁜ Buddha on meat eating

*-by Aryadasa Ratnasinghe*

## ⁜ එකොළොස් ගින්නෙන් ගෙයක් ගිනි ගනී

– ගොඩගම චන්දදස්සී දසසිල් මාතාව

ජීවිතය පිළිබඳ පුද්ගලයා විසින් ඇතිකර ගත යුතු යථා දර්ශනය පැහැදිලි කිරීමට උත්සාහ දරන ලිපියකි. ජීවිතය තුළ සැබෑ සාර ගවේෂණයක් සිදුවන්නේ – ධර්මාවබෝධය තුළින් පමණක් බව පැහැදිලි කිරීමට මෙම ලේඛිකාව උත්සාහ දරයි.

## ⁜ ලෝකයේ ගමන් මග වෙනස් කළ සම්බුද්ධ දේශනාව

– නෙළුවාකන්දේ ඤාණානන්ද හිමි

ඇසළ පෝ දිනයක සිදු වූ බුදුරදුන්ගේ පළමු දෙසුම වූ දම්සක් පැවතුම් සූත්‍රයෙන් හෙළි වන ගැඹුරු ජීවන දර්ශනය. එතෙක් භාරතයේ පැවති වැරැදි මතවාද රැසක් ඛණ්ඩනය කළ බෞද්ධ ප්‍රතිපද මාර්ගය පිළිබඳ විමර්ශනයකි.

## ⁜ බුදු සිරිත සිතුවමෙන්

## ⁜ ඇසළ සිරියෙන් බබළන කතරගම පුදබිම

– කපුගම සරණතිස්ස නාහිමි

'සිරිලක පුදබිම්' විශේෂාංගය යටතේ ජූලි මස 29 වැනිද ඇරැඹීමට නියමිත කතරගම ඇසළ පෙරහර නිමිත්තෙන් පළ වන ලිපියකි. කතරගම ඇසළ පෙරහර පිළිබඳ ඉතිහාසය හා එහිදී සිදු කැරෙන විවිධ චාරිත්‍ර ආදිය පිළිබඳ විස්තර මෙම ලිපියට ඇතුළත්ය.

## ⁜ පැපිලියාන ශ්‍රී සුනේත්‍රාදේවි පුරාණ රාජමහා විහාරය

– උස්ගමුයායේ සමිත හිමි

කොළඹ දිස්ත්‍රික්කයේ දෙහිවල – ගල්කිස්ස නගර සභා සීමාවට අයත් ප්‍රදේශයේ පිහිටි ඉපැරැණි ඓතිහාසික විහාරස්ථානයක් පිළිබඳ තොරතුරු.